# උපන් රටට නොමැකෙන නමක් තැබූ ඩී.බී. විජේතුංග

**ශ්‍රී ලංකාවේ තෙවැනි ජනාධිපති ඩී.බී. විජේතුංග මහතාගේ 108 වැනි ජන්ම දිනය අදට (15) යෙදී ඇත. මේ ලිපිය ඒ නිමිත්තෙනි.**



මහාමාත්‍ය ඩී.එස්. සේනානායක රජයේ ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයකු වූ අමාත්‍ය ඒ. රත්නායක මහතාගේ පෞද්ගලික ලේකම්වරයා වශයෙන් කටයුතු කළ විජේතුංග මහතා 1946 වර්ෂයේ එක්සත් ජාතික පක්ෂය ආරම්භ කරනලද අවස්ථාවේදී මහනුවරින් දෙවැනි සාමාජිකයා ලෙස පක්ෂයට එක්විය. 1956 වසරේ සිට ක්‍රියාකාරී දේශපාලනයට පිවිසි එතුමා එම වර්ෂයේත් 1960 මාර්තු මාසයේ පැවැති මහ මැතිවරණවලදී ස්වාධීන අපේක්ෂකයකු වශයෙන් ද, යළිත් 1960 ජූලි මහ මැතිවරණයේදී උඩුනුවර ඡන්ද කොට්ඨාසය සඳහා එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයකු වශයෙන්ද තරග කළේය. 1965 මහ මැතිවරණයේදී එම ඡන්ද කොට්ඨාසයෙන්ම තරග කර විජයග්‍රහණය ලබමින් පළමු වරට පාර්ලිමේන්තුවට සපැමිණි විජේතුංග මහතා 1977 මැතිවරණයෙන්ද විශිෂ්ට ජයග්‍රහණයක් හිමි කර ගනිමින් දෙවැනි වරටත් මන්ත්‍රීවරයකු වශයෙන් පත්විය.

1977 වසරේදී හිටපු ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන මහතාගේ අමාත්‍ය මණ්ඩලයේ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමැතිවරයා විය.

1978 වසරේදී විදුලිබල හා මහාමාර්ග ඇමැති තනතුර ද, ඊට අනතුරුව තැපැල් හා විදුලි සංදේශ ඇමැති තනතුර ද දරමින් සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කළ ඩී.බී. විජේතුංග මහතා 1979 වසරේදී තැපැල් හා විදුලි සංදේශ අමාත්‍ය සහ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා වශයෙන් යළිත් දිවුරුම් දුන්නේය. 1987දී ආහාර සහ කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ ඇමැතිවරයා වශයෙන් නැවත පත් වූ එතුමා 1988 වර්ෂයේදී වයඹ පළාතේ ආණ්ඩුකාර ධුරයට පත් කෙරිණි. ඉතා කෙටි කාලසීමාවක් එම ආණ්ඩුකාර ධුරය හෙබවූ විජේතුංග මහතා, 1989 වසරේ පැවති මහ මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය යටතේ තරග කර තුන්වන වරටත් මහනුවර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් පාර්ලිමේන්තුවට පැමිණ ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා වශයෙන් කටයුතු කිරීමේ භාග්‍යය ද උදකර ගත්තේය. අගමැති ධුරයට අමතරව මුදල් ඇමැති ධුරය ද හෙබවීමේ වාසනාව ලද එතුමාට රණසිංහ ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමා විසින් කම්කරු, සමාජ සුබසාධන හා වෘත්තීය පුහුණු අමාත්‍ය ධුරයේ විෂයපථය ද භාර කරන ලදී.

1993 මැයි මස පළමුවැනිද එවකට ජනාධිපති රණසිංහ ප්‍රේමදාස මහතාගේ අභාවයෙන් පසු ශ්‍රී ලංකාවේ පූර්ණ විධායක බලතල සහිත ජනාධිපති ධූරයේ වැඩ බැලීමේ භාරදූර කාර්යය ද විජේතුංග මහතා වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පැවරුණි. නිහතමානී, අල්පේච්ඡ ජීවිතයක් ගත කරමින් පෞද්ගලිකත්වය හා හුදු ආත්මාර්ථය පසෙක තබා පරාර්ථය වෙනුවෙන්ම ක්‍රියා කළ ඩී.බී. විජේතුංග මහතා 1993 මැයි මස හත්වැනිද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ඒකමතික තීරණය පරිදි ලංකාවේ තුන්වැනි විධායක ජනාධිපති ධූරයෙන් පිදුම් ලැබීය.

උඩුනුවර ඡන්ද කොට්ඨාසයේ ජනතාවට අවශ්‍ය පොදු පහසුකම් සපයා දීමට නිබඳවම කටයුතු කළ එතුමා ආගමික වශයෙන් ද ප්‍රදේශයට අනුපම සේවයක් ඉටු කළේය.

1994 වර්ෂයේදී ජනාධිපති ධුරයෙන් විශ්‍රාම ගත් එතුමා එම වර්ෂයේදීම ක්‍රියාකාරී දේශපාලනයෙන් ද ඉවත් වූයේය. අනතුරුව විශ්‍රාම සුවයෙන් පිළිමතලාව නිවසට වී කල් ගත කළ හිටපු ජනාධිපතිවරයා සිය කොළඹ කාර්යාලය හා නිල නිවස ද රජයට ආපසු ලබා දෙමින් තම නිවසෙහිම තමනට හිමි කාර්යාලය පිහිටුවා ගත්තේ තවත් මාහැඟි ආදර්ශයක් රටට ලබා දෙමිනි.

සමස්ත දේශපාලන ක්ෂේත්‍රයටම ආදර්ශවත් චරිතයක් වූ විජේතුංග මහතාගෙන් උගත හැකි පාඩම් ගණනාවකි. බලයෙන් උදම් නොවී එතුමා ගත කළ මහත්මා දේශපාලන ජීවිතය ආදර්ශවත්ය.

ජනපති ඩිංගිරි බණ්ඩා විජේතුංග මහතාට නිවන් සුව අත්වේවා.

**හිටපු උසස් අධ්‍යාපන, නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍ය**

**ලකී ජයවර්ධන**